# 10 ආරම්භක දේව ප්‍රසාද නිධාන

ආරම්භක දේව ප්‍රසාද නිධාන

- ප්‍රසාද ස්නාපනය
- දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ
- අභිවෘද්ධි ආලේපය

## 1. ප්‍රසාද ස්නාපනය



10.1 රූපය - ජෝර්දාන් නදියේ දී ජේසුස් වහන්සේ බෞතීස්ම ස්නාපනය ලැබීම

ප්‍රසාද ස්නාපනය එක වරක් පමණක් ලැබිය හැකි දේව ප්‍රසාද නිධානයකි. දේව දරුකම නමැති නොමැකෙන ලාංඡනය පුද්ගලයාගේ ආත්මය තුළ එමගින් සනිටුහන් වේ.




## ප්‍රසාද ස්නාපනයේ දී භාවිත වන සංකේත



10.2 රූපය - ජලය වත් කිරීම



10.3 රූපය - සුදු වස්ත්‍රය පැළඳවීම

### 1. ජලය

පාපයට මිය යාම හා වරප්‍රසාදීය ජීවිතයකට උත්ථාන වීම සංකේතවත් කරයි.

### 2. සුදු වස්ත්‍රය

ක්‍රිස්තුන් වහන්සේ පැළඳ ගැනීම (ගලාති 3:07) හා ආත්මික ජීවිතය කිලිටි වීමට ඉඩ නොදී තබා ගැනීමේ අවශ්‍යතාව සංකේතවත් කරයි.



10.4 රූපය - ඉටි පහන් දැල්වීම



10.5 රූපය - ශුද්ධ වූ තෛලයෙන් ආලේප කිරීම

3. පාස්කු ඉටිපහන

උත්ථාන වූ ක්‍රිස්තුන් වහන්සේ විසින් නවක කිතුනුවා ආලෝක කරනු ලැබූ බව හා එම ආලෝකය නිවීමට ඉඩ නොදිය යුතු බව සංකේතවත් කරයි.

4. ශුද්ධ වූ තෛලය

ශුද්ධාත්ම වරම් ලැබීම සංකේතවත් කරයි.

## 2. අභිවෘද්ධි ආලේපය

(විරිඳුවක් ආකාරයෙන් පහත ගීය ගයන්න.)



පෙන්තකොස්ත දිනයේ දී ගෝලයෝ සැම එකතු වෙලා
දෙවිඳුන් යදිමින් නිවසක (රැස් වී සිටියලු එක් වී) //

සැඩ සුළඟක හඬකින් ගේ හදිසියේම පිරිලා ගියා
ගිනි දළු වැනි දිව් බෙදිලා (ගෝලයෝ මත වැඩ සිටියා) //

සුදතුමගෙන් පිරුණු ඒ ගෝලයෝ සැම එඩිතර වී
නොබිය ව සුපුවත දසතම (පතුරා සැමහට දෙසුවා) //

මිහිපිට සැම දෙසකින් එහි පැමිණි ජුදෙව්වන් සැම දෙන
ජෙරුසලමේ රැස් වී ඒ (දෙසුමන් සැම අහ ගත්තා) //

ගලීලයෝ තම බසින් ම අමතනු ඔවුනට ඇසුණි
මවිත වූ ඔවුනට ගෝලයෝ (පවසන දෙව් විකුම් ඇසුණි) //

සුදතුම් වරමින් පැවසූ සුබ වදනින් පෝෂණ වී
තුන් දහසක් පමණ දෙනා (දෙව් දහමට නතු වූවෝ) //

එදා පෙන්තකොස්ත දින ගෝලයන් වෙතට ශුද්ධාත්මයාණන් වහන්සේ වැඩම කළාක් මෙන්, අද අප වෙතට ද අභිවෘද්ධි ආලේපය නමැති දේව ප්‍රසාද නිධානය තුළින් ශුද්ධාත්මයාණන් වහන්සේ වැඩම කරන සේක. සෑම ක්‍රියාවකට ම පෙර ශුද්ධාත්මයාණන් වහන්සේට යාච්ඤා කිරීම තුළින් ශුද්ධාත්ම මඟ පෙන්වීම බලය හා ශක්තිය අපට නො අඩුව ලැබේ. එමෙන් ම ප්‍රසාද ස්නාපනයෙන් අප ලද නව ජීවිතය වර්ධනය වන්නේ, අභිවෘද්ධි ආලේපයෙනි. අභිවෘද්ධි ආලේපය තුළින් ශුද්ධාත්ම වරම් ලබා පරිණත කිතුනුවන් ලෙස සාක්ෂි දැරීමේ වගකීම අපට පැවරෙයි.

## 3. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ



10.6 රූපය - අන්තිම රාත්‍රී භෝජන අවස්ථාව

> උන් වහන්සේ රොටී ගෙන තුති පුද, ඒවා කඩා, ඔවුන්ට දී, "ඔබ උදෙසා දෙනු ලබන මාගේ ශරීරය මේ ය. මා සිහි කිරීම පිණිස මෙය, සිදු කරන්නැ"යි වදාළ සේක.
>
> (ලූක් 22:19)

අන්තිම රාත්‍රි භෝජන අවස්ථාවේ දී ජේසුස් වහන්සේ භාවිත කළ මෙම වචන තුළින් ඔවුන් වහන්සේ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ස්ථාපිත කළ සේක. ආරම්භක දේව ප්‍රසාද නිධාන සම්පූර්ණත්වයට පත්වන්නේ, දිව්‍ය සත්ප්‍රසාදය ලැබීමෙනි.

# ලන්චියානෝ නුවර දිව්‍ය සත්ප්‍රසාදයීය ප්‍රාතිහාර්යය



10.7 රූපය - දිව්‍ය සත්ප්‍රසාදයීය වහන්සේ

**දිව්‍ය සත්ප්‍රසාද ප්‍රාතිහාර්යය සිදු වූ කාලය** - ක්‍රි.ව. 700 දී පමණ

| | |
|---|---|
| **ප්‍රාතිහාර්යය සිදු වූ ස්ථානය** - | ඉතාලියේ ලන්චියානෝ නුවර ශුද්ධ වූ ලෙගොන්ෂියන් මුනිතුමාට කැප කරන ලද දෙව්මැදුරේ දී |
| **සිදු වූ ප්‍රාතිහාර්යය** - | පූපය හා මිදි යුෂ ජේසුස් වහන්සේගේ ශ්‍රී ශරීරයට හා ශ්‍රී රුධිරයට හැරෙන්නේ දැයි සැක කළ එක්තරා තාපස පියතුමෙක් පූපය හා මිදි යුෂ දිවරහස් කරන අවස්ථාවේ දී පූපය මස් කැබැල්ලක් බවටත් මිදි යුෂ රුධිරය බවටත් පරිවර්තනය විය. |

**1574 දී කළ විද්‍යාත්මක පර්යේෂණයේ දී ලැබුණු ප්‍රතිඵලඃ**

කැටි ගැසී තිබූ විවිධ හැඩවලින් යුත් අසමාන කොටස් කිරා බලන විට සැම කොටසක ම බර එක සමාන විය. එමෙන් ම සියලු කොටස් එකට කිරන විට ලැබූ බර ද එක රුධිර කැටියක බරට සමාන විය.

**1978 දී කළ විද්‍යාත්මක පර්යේෂණවල ප්‍රතිඵලඃ**

- ★ මස් කැබැල්ල හා රුධිරය සැබැවින් ම මනුෂ්‍යයකුගේ බව හා මස් කැබැල්ල මිනිස් හදවතකින් ගත් එකක් බව
- ★ මස් කැබැල්ලෙත් රුධිරයෙත් අඩංගු රුධිර වර්ගය AB පොසිටිව් බව

- ශරීරයකින් අලුතින් ලබා ගත් රුධිරයක මෙන් ප්‍රෝටීන් හා ඛනිජ වර්ග රුධිරයෙන් ඉවත් නොවී දිගට ම පවතින බව
- මස් කැබැල්ලට හා රුධිරයට කිසි ම කල් තබා ගැනීමේ ද්‍රව්‍යයක් යොදා නොමැති බව
- ශතවර්ෂ 12කට අධික කාලයක් පරිසරයට නිරාවරණ ව පැවතුණ ද මෙම මස් කැබැල්ල හා රුධිරය නරක් වී නොමැති බව.

### 1970 වර්ෂයේ දී කළ පර්යේෂණයේ අනාවරණ

ටියුරින් නුවර ශ්‍රී සළුවෙත් ලන්චියානෝ නුවර මස් කැබැල්ලේ හා රුධිරයේත් ඇත්තේ AB පොසිටිව් බව නාසා ආයතනය විසින් අනාවරණය කරන ලදි.

එබැවින් ජීවමාන ජේසු සමිඳුන් වැඩ සිටින දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ගෞරවයෙන්, භක්තියෙන් හා ආශාවෙන් නිතර නිතර ලබා ගත යුතු ය. ඒ තුළින් අප ජීවිත පෝෂණය වන අතර, වරප්‍රසාදයෙන් පූර්ණ ව වර්ධනය වේ. එබැවින් හැකි සැම විට ම දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගත යුතු ය.

**ක්‍රියාකාරකම**

1. ප්‍රසාද ස්නාපනයෙන් ඔබ ලැබූ නව ජීවිතය වර්ධනය කර ගන්නේ කෙසේ ද?
2. පෙන්තකොස්ත දිනය සම්බන්ධ විරිඳුවෙන් ඔබ උගත් කරුණු **පහක්** ලියන්න.



**ජීවිතයට බිඳක්**

***හැකි සැම විට ම දිව්‍ය පූජාවට සහභාගි වී දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගන්න.***